# 1990 A/L ව්‍යුහගත රචනා ගැටළු අංක (04)

රූපයෙහි දක්වා ඇත්තේ සළ දඟර ගැල්වනෝමීටරයක කොටසකි. A මගින් දක්වා ඇත්තේ සිලින්ඩරාකාර මෘදු යකඩ මධ්‍යයක් වන අතර එය වටා කම්බි දඟරයක් පුරුසු ආකාරයට ඔතා ඇත්තේ දිග $l$ සහ පළල b වන සෘජුකෝණාස්‍රාකාර පුඩු n සංඛ්‍යාවක් ඇති වන ලෙස ය.




**(a)** යකඩ මධ්‍යය සහ චුම්බක ධ්‍රැව සංහා සිලින්ඩරාකාර හැඩයක් ලබා දීමට හේතුව කුමක් ද?

**(b)** ගැල්වනෝමීටරයෙහි භාවිත කරන කම්බි දඟරය පරිවරණය කරන ලද එකකි. මෙයට හේතුව කුමක් ද?

**(c)** දඟරය අවට චුම්බක ස්‍රාව ඝනත්වය B නම් දඟරය හරහා I ධාරාවක් ගමන් කරන විට චුම්බක ක්ෂේත්‍රය මගින් එය මත ඇති කරන බල යුග්මයෙහි ඝූර්ණය සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

**(d)** ව්‍යාවර්ත නියතය C වන සර්පිල දුන්නක ක්‍රියාකාරිත්වය මගින් එම ඝූර්ණය සංතුලනය කරනු ලැබේ. (c) හි දක්වන ලද බල යුග්මයෙහි ඝූර්ණය සහ ගැල්වනෝමීටරයෙහි උත්ක්‍රමය $\theta$ සම්බන්ධ කෙරෙන සමීකරණයක් ලියන්න.

**(e)** මෙවැනි ගැල්වනෝමීටරයක අග්‍ර අතර ප්‍රතිරෝධය $2\,\Omega$ බව මැනීමෙන් දැන ගන්නා ලදී. මෙම ප්‍රතිරෝධය ඇති වන්නේ කෙසේ ද?

**(f)** (e) හි දක්වන ලද ගැල්වනෝමීටරයෙහි පූර්ණ පරිමා උත්ක්‍රමය 15 mA වේ. මෙම ගැල්වනෝමීටරය වි.ගා.බ. 60 mV සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය $1\,\Omega$ වූ ප්‍රභවයක් හරහා කෙළින්ම සම්බන්ධ කර එම පරිපථයෙහි ගලන ධාරාව මැනිය හැකි ද? ඔබේ උත්තරය පැහැදිලි කරන්න.

**(g)** (f) හි දක්වා ඇති අකාරයට සම්බන්ධ කළ විට ගැල්වනෝමීටරයෙහි පාඨාංකය හරියට ම 15 mA සේ පෙන්වීමට ඔබට අවශ්‍ය නම්, ඔබ එය සපුරා ගන්නේ කෙසේ ද?